සේරුවිල ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | අදහස් දැක්වීම් සිදු කර නොමැත. |

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට පැවති ඉදිකිරීමේ ව්‍යාපෘතියකට අදාළව රු.284,533 ක බැංකු ගිණුමේ ශේෂය අවසන් ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉතිරිව පවතින මුදල සභා අරමුදලට ගැනීම හෝ ඵලදායි ඉදිකිරීම් කටයුත්තක් සඳහා යොදා ගත යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.284,533 ක බැංකු ගිණුමේ ශේෂව පැවති මුදල ගිණුමට නොගෙන තිබූ බැවින් ගිණුම අවසන් කර එහි තිබෙන ශේෂය අපගේ සභා ගිණුමට ලබා ගන්නා බව සඳහන් කරමි. |
| (ආ) | 2018 වර්ෂය තුළදී මිලදී ගත් රු.1,602,577 ක් වටිනා වත්කම් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | වර්ෂය තුළදී මිලදී ගන්නා ස්ථාවර වත්කම් සඳහා ප්‍රාග්ධනයෙන් | 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් සකස් කිරීමේදී මෙය නිවැරදි කරමි. |

ආදායමට දායක වීමේ ගිණුමට බැර කළ යුතු වේ.

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | (i) 59 වැනි රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේ දී සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සෑම වර්ෂයක් ආරම්භයේ දී සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් කළ යුතු වේ. | සභාවේ ආදායම් නිලධාරී තනතුරු දෙකක් පවතින අතර ඉන් එක් තනතුරක් සඳහා පුරප්පාඩුවක් පවතී. සභාවේ ආදායම එකතු කිරීම හා තනතුරට සම්බන්ධ සියලු රාජකාරි එක් නිලධාරියෙක් මගින් සිදුකිරීම නිසා මෙම ගැටළුව පැන නැගී ඇත. කෙසේ වෙතත් මෙම වසර තුළ එම සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට හැකිබව සඳහන් කරමි. |
| | (ii) 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව යාවත්කාලීන කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කොට පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛනයේ පවතින අඩුපාඩු සකස්කොට වඩාත් නිවැරිදි ආකාරයෙන් යාවත් කාලීන කොට පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා බව සඳහන් කරමි. |
| (ආ) | 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 | 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව සඳහන් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,913,108 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,562,806 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි 2018 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සෑම මාසයක් අවසානයේදී ම රු. මිලියන 13 ත් රු. මිලියන 17 ත් අතර ප්‍රමාණයක ශේෂයක් පැවති අතර මෙම අතිරික්ත මුදල් සුදුසු පරිදි ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවට ආදායමක් ලැබෙන ආරක්ෂිත ආයෝජන මාර්ගයක ආයෝජනය කර ආදායම් උත්පාදනය කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කරුණ ප්‍රාදේශීය සභාවට යොමු කොට සභාවෙන් ලබාදෙන තීරණය පරිදි කටයුතු කිරීමට පියවර ගන්නා බව සඳහන් කරමි. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 3,835 | 3,958 | 3,138 | 165 | 3,815 | 4,166 | 3,842 | 324 |
| බලපත්‍ර ගාස්තු | 565 | 1,605 | 816 | - | 415 | 433 | 433 | - |
| වෙනත් ආදායම් | 7,186 | 16,069 | 12,538 | 2,269 | 7,183 | 11,967 | 5,788 | 4,910 |

2.3.2 කුලී

------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ---------------- | ------------------ |
| (අ) | කඩකාමර සහ තානායම සඳහා 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලැබිය යුතු කුලී රු.981,314 ක් අයකර ගෙන නොතිබුණි. | කඩකාමර හා තානායම වෙනුවෙන් ලැබිය යුතුව පවතින කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව නීතිමය කටයුතු සිදු කිරීමට නීතීඥයකු සඳහා මුදල් ගෙවීමට සභා අනුමැතිය ලබාගත් අතර ඉදිරියේදී නීතිමය පියවර තුළින් අදාළ හිඟ මුදල් පියවා ගැනිමට කටයුතු කරමි. |
| (ආ) | මෝටර් ග්‍රේඩරය කුලියට ලබා දීමේ දී දිස්ත්‍රික් මිල කමිටුවේ මිල ගණන් අනුව කුලී ලබා නොගැනීම මත රු.166,460 කට ආසන්න වූ ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | දිස්ත්‍රික් මිල කමිටු මිල ගණන් අනුව කටයුතු කළ යුතු වේ. | සේරුනුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවට සහනදායි මුදලක් ලෙසින් මෙම මුදල JCB හා මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය සඳහා අය කරනු ලබයි.මෙම මුදල් අයකිරීමේදී ප්‍රවාහනය සඳහා වැයවන මුදල ද එකතු කොට අයකරනු ලබයි.කෙසේ නමුත් ඉදිරියේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් නියම කරන ලද මිල ගණන් අනුව කටයුතු කිරීමට අදාළ පියවර ගන්නා බව දන්වා සිටිමි. |
| (ඇ) | JCB යන්ත්‍රය කෙසේ නමුත් මෙම යන්ත්‍රය කුලියට දීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් එවන ලද නියමිත මිල ගණන්වලට අනුව කුලියට ලබා නොදීම මත රු.65,375 කට ආසන්න ආදායම් මුදලක් අහිමි වි තිබුණි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් නියම කරන ලද මිල ගණන් අනුව කටයුතු කළ යුතු වේ. | ගණන් දීමේ නිලධාරීන් විසින් අදහස් දැක්වීම් සිදු කර නොමැත. |

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ---------------- | -------------------- |
| 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවට අයකර ගැනීමට පැවති උසාවි දඩ මුදල රු.4,909,712 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ අයකර ගැනීමට 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.4,909,712 ක් විය. | මේ වන විට අප විසින් අදාළ මුදල් ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අදාළ ඉල්ලීම් ඉදිරිපත්කර ඇති අතර ඉදිරියේදී එම මුදල් ප්‍රමාණයක් ලැබෙනු ඇති |

| | |
|---|---|
| 2017 හා 2018 වර්ෂයන් සඳහා මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බවට බලාපොරොත්තු වෙමි. |

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කාර්යය සාධනය
---------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ

(අ) අතුරු ව්‍යවස්ථා
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කොට ඒ අනුව කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ දී ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙක්ටයාර 0.4 ක ඉඩමක් සේරුවිල බිට්ටුව ප්‍රදේශයෙන් ලබා දී තිබියදී සභාව විසින් එකතු කරනු ලබන | විධිමත්ව කසළ බැහැර කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙක්ටයාර 0.4ක පමණ වූ ඉඩම් කොටසක් කොම්පෝස්ට් නිශ්පාදනාගාරයක් ඉදි කිරීම සඳහා ලබා දීමට 2014 වර්ෂයේ අනුමැතිය ලබා දී |

| | | |
|---|---|---|
| කසළ එම ඉඩමට බැහැර නොකර අවිධිමත් ලෙස වනජීවි දෙපාර්තමේන්තුවට අයත් ඉඩමකට බැහැර කර තිබුණි. | | ඇතත් එම භූමිය ලිඛිතව ලබා දීමට කටයුතු කර නොමැත. මේ පිළිබඳව විමසීම් කිරීමේදී එම භූමියේ කොම්පෝස්ට් නිශ්පාදනාගාරයක් ඉදි කිරීමට පෙර පරිසර වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය බව වාචිකව දන්වා ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෑම වයසකම ජීවත්වන මිනිසුන්ගේ හොඳ සෞඛ්‍ය තත්ත්වයක් ඇති කරලීම තිරසර සංවර්ධන අරමුණකි. ඒ සඳහා අඩුබර සහිත උපත් ප්‍රමාණය අඩුකර ගැනීම එය තහවුරු කර ගැනීම සඳහා බලපාන එක් සාධකයක් වුවත් සේරුවිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු බර සහිත උපත් ප්‍රමාණය පිළිබඳ සැලකීමේදී 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය වන විට ක්‍රමයෙන් වැඩි වී ඇති අතර එය දරුවන්ගේ මනා වර්ධනයට බාධාවක් වන නමුත් සභාව මඟින් එය අඩුකර ගැනීම සඳහා මේ වන තෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එම අඩු බර සහිත උපත් පිළිබඳ වූ තොරතුරු පහත පරිදි දැක්විය හැකිය. | තිරසර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීමට සභාව කටයුතු කළ යුතුය. | සේරුවිල ප්‍රදේශයේ අඩුබර දරු උපත් පිළබඳ සභාවේ අවධානයට යොමුකොට මෙම තත්වය අවම කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව සඳහන් කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය
---------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආර්යුර්වේද වෛද්‍ය තනතුර 2012 අගෝස්තු මස සිට පුරප්පාඩුව පැවතුණි. | ආයුර්වේද වෛද්‍ය තනතුරෙහි වූ පුරප්පාඩු සම්පූර්ණ කරවා ගතයුතු වේ. | ඉදිරියේදී මෙම පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව සඳහන් කරමි. |
| (ආ) | පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරි හා ආදායම් පරීක්ෂක යන තනතුරුවල වර්ෂ 05 කට වැඩි | පවතින පුරප්පාඩු සම්පූර්ණ කරවා ගතයුතු වේ. | ඉදිරියේදී මෙම පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව සඳහන් |

| | | |
|---|---|---|
| කාලයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | | කරමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවය කල ආයුර්වේද වෛද්‍ය නිලධාරියා වෙනත් ස්ථානයකට මාරු වී යාමෙන් පසු වෛද්‍යවරයකු පත් නොකිරීම නිසා වෛද්‍ය මධ්‍යස්ථානය 2014 ජුනි මස සිට වසා තිබුණි. තවද ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය වසා තිබීම හේතුවෙන් එහි ඇති රු. 45,078 ක් වටිනා බෙහෙත් ඖෂධ 22 ක් භාවිතයට ගත නොහැකි තත්වයට පත්වී තිබුණි. | පවතින ආයුර්වේද වෛද්‍ය තනතුරෙහි වූ පුරප්පාඩුව සම්පූර්ණ කරවා ගතයුතු වේ. | ඉදිරියේ ආයුර්වේද වෛද්‍යවරයෙකු ලබාගෙන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරන බවට දන්වා සිටිමි. |
| (ආ) | සභාවට අයත් සුපිරි කඩකාමර 06 ක් ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව පෙර වර්ෂයේ බදු ගත් පුද්ගලයන් සඳහාම 2018 වර්ෂයට ද ලබා දී තිබුණි. කෙසේ නමුත් එම කඩකාමරවලින් කඩකාමර 02 ක් සඳහා රු.85,580 ක කුලී මුදලක් අයකර ගත යුතුව පැවති අතර ගිවිසුම් අත්සන් නොකිරීම නිසා නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි වී තිබුණි. | බදු දීමේදී ගිවිසුම් අත්සන් කළ යුතු අතර පවතින හිඟ මුදලද අයකර ගත යුතු වේ. | මෙම හිඟ මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකොට ඇති බවත් වාරික වශයෙන් හිඟ මුදල් ලබා ගැනීම ආරම්භකොට ඇති බවත් දන්වා සිටිමි. |
| (ඇ) | 2017 මාර්තු 07 වන දින රු.49,500 කට මිලදී ගත් ඇඟිලි සලකුණු යන්ත්‍රය මාස 03 කින් පසුව ක්‍රියාවිරහිතව පැවති නමුත් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතා කළ යුතු අතර එහි මාසික පිටපත් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඇඟිලි සලකුණු යන්ත්‍රය අළුත්වැඩියා කොට ඉදිරියේදීභාවිතයට ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වනජීවි දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් 25 ක 2018 දෙසැම්බර් 31 වන විට රු. 68,008,546 ක් වටිනා ක්‍රීඩාංගන, පොදු ළිං, ප්‍රජා ශාලා, ජල ටැංකි, සුසානාගාර හා පොදු වෙළඳපලවල් ආදිය ඉදිකර තිබූ නමුත් මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගත යුතු වේ. | ප්‍රාදේශීය ඉඩම් සභාවට පවරා ඇති නමුත් ඒ සඳහා මේවන විටත් හිමිකම් ඔප්පු ලබා දී නොමැති බැවින් , හිමිකම් ඔප්පු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් අදාළ ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ප්‍රාදේශීය ලේකම් සේරුවිල වෙතින් ඉල්ලා ඇති අතර ප්‍රාදේශීය ලේකම් විසින් අවශ්‍ය බව සඳහන් කර ඇති තොරතුරු මේවන විටත් ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ඉදිරිපත් කර ඇත. |

3.4.2 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව පවතින වාහන 05 ක් අවුරුද්දකට වඩා වැඩි කාලයක සිට අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයවැයෙන් වෙන්කෙරෙන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ඉදිරියේදී මෙම වාහන අලුත් වැඩියා කිරීමට කටයුතු කරමි. |

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර අලංකරණය සහ සභාවට ආදායමක් ලබා ගැනීමේ අරමුණින් දැන්වීම් ප්‍රචාරය සඳහා LED දැන්වීම් පුවරුවක් සවි කිරීම වෙනුවෙන් .......... වර්ෂයේදී රු.938,000 ක් වැය කර තිබුණි. මෙම දැන්වීම් පුවරුව ක්‍රියාත්මක කිරීමේ දී යෙදිය යුතු ආලෝක ප්‍රමාණය හා ප්‍රචාරය කල හැකි දැන්වීම් ප්‍රමාණය පිළිබඳ සැළකිල්ලක් නොදක්වා කටයුතු කිරීමෙන් 2014 මාර්තු 17 දින සිට | උපරිම ප්‍රයෝජනයක් ලබා ගත හැකිවන අයුරින් සුදුසු කටයුතු යෙදිය යුතු වේ. | මෙම LED තිරය 2014 වර්ෂයේදී මිළදීගෙන ස්ථාපිත කර ඇති අතර ඉන් අනතුරුව අවස්ථා කිහිපයකදී නැවත අලුත් වැඩියා කිරීම සිදුකොට ඇත.ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කොට ආදායම් උපයා ගැනීමේ අරමුණින් ස්ථාපිත කරන ලද මෙය තුළින් බලාපොරොත්තු වූ ආකාරයේ ආදායමක් ලබා ගත නොහැකිවීම හා නඩත්තු |

| | | |
|---|---|---|
| අක්‍රීය වී තිබිණි. මේ හේතුවෙන් මේ සඳහා වැය කල මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | | වියදම අධික වීම මත දීර්ඝ කාලයක් තිස්සේ අලුත් වැඩියා කිරීමක් සිදුකොට නොමැත. කෙසේ නමුත් වර්තමානයේදී LED තිරය සකසා ගතහැකි වුවහොත් සැලකිය යුතු ආදායමක් උපයාගනු ඇත. එම නිසා සභා අනුමැතිය ලබාගෙන මෙම LED තිරය අලුත්වැඩියා කොට භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. |

3.6 ලිංගපුරම් පුස්තකාලය ඉදිකිරීම

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලිංගපුරම් පුස්තකාලය ඉදිකිරීම 2016 නොවැම්බර් 14 දින නිම කළයුතු වුවද 2017 මාර්තු 15 දින නිම කිරීම නිසා ප්‍රමාද වූ මාස 04 ක් සඳහා ප්‍රමාද ගාස්තු රු. 336,819 ක් අඩුකර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අඩු කළ යුතු වේ. | කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කරදෙන ලෙස 2016/11/12 දින ඉල්ලීම් කර ඇත. ඒ සම්බන්ධව ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙත කාලය දීර්ඝ කරදෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව දින දීර්ඝ කිරීම සඳහා ලිඛිත අනුමැතියක් ලැබුණු බවට විශ්වාස කරන අතර ඉදිරි කාලයේදී ඒ පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට කටයුතු කරමි. රු.281,000ක රැඳවුම් මුදලක් මෙම කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට ඇති අතර මෙම දින දීර්ඝ කිරීමේ අනුමැතිය තහවරු කරගන්නා තෙක් අදාළ මුදල් ප්‍රමාණය නිදහස් නොකරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුස්තකාලය සඳහා White Board සවි කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු. 35,000 ක් ගෙවා තිබුණු නමුත් එය සවිකර නොතිබීම නිසා එම මුදල වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ මුදල අයකරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | P14 යටතේ වැඩබිමේ සැලසුම් සටහන් කිරීම හා දිනපතා ඉදිකිරීම් වැඩ විස්තරය සටහන් කිරීම, කම්කරුවන්ගේ වැඩබිමේ කාර්යන්වල නියුතුවීම සටහන් කිරීම, දිනපතා වැඩ ප්‍රමාණය සටහන් කිරීම, දිනපතා වැඩ ප්‍රමාණය සටහන් කිරීම සඳහා Sign Board එකක් කොන්ත්‍රාත්කරුගේ තාවකාලික උපකාර්යාලයේ පවත්වාගෙන ගිය බව වාර්තා කරමි. |